# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2010 අංක 9 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2010 අගෝස්තු මස 17 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 අගෝස්තු මස 20 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 5.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# 2010 අංක 9 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2010 අගෝස්තු මස 17 වැනි දින]

එල්.ඩී.—ඕ. 60/2006.

1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2010 අංක 9 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත, එහි 9 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1983 අංක 24 දරන පනතට 9අ සහ 9ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"හදිසි නීති, නියෝග ආදිය යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියා හේතුවෙන් මිය යන රාජ්‍ය නිලධාරිනියන් ආදීන්ට විශ්‍රාම වැටුප් ගෙවීම.

9 (අ) (1) මේ පනත යටතේ අඩුකර ගැනීම්වලට යටත් වන්නා වූ යම් නිලධාරිනියක්, තත්කාලයේ බලපවත්නා යම් හදිසි නීති නියෝගයක් යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් හේතුවෙන් හෝ යම් ස්වාභාවික ආපදාවක් හේතුවෙන් ඇය විශ්‍රාම ගන්නා වයසට එළඹීමට පෙරාතුව මිය යන අවස්ථාවක දී, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ නිලධාරිනිය ගේ වැන්දඹු පුරුෂයා සහ දරුවන් ;

(අ) ඒ නිලධාරිනිය මියගිය අවස්ථාවේ දී ලබමින් සිටි වැටුප මත පදනම්ව මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඇය මිය ගිය දින සිට, ඇය ජීවත්ව සිටියේ නම් ඇය ඇයගේ විශ්‍රාම ගැනීමේ වයසට එළඹෙන දිනය තෙක්, ලැබීමට හිමිකම් ලැබිය යුතු ය ; සහ

(ආ) ඒ නිලධාරිනිය විශ්‍රාම ගත යුතු වයස තෙක් ලැබීමට හිමිකම තිබූ සියලු වැටුප් වැඩිවීම් සහිත වූ සංශෝධිත

වැටුප මත පදනම්ව, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඇය ජීවත්ව සිටියේ නම් ඇය විශ්‍රාම ගැනීමේ වයසට එළඹිය යුතු වූ දින සිට සහ ඉන් පසුව ලැබීමට හිමිකම තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී, විශ්‍රාම ගැනීමේ වයස යන්න, අදාළ නිලධාරිනියගේ මරණය පිළිබඳ අවස්ථානුගත තත්ත්වයන් ද, ඇයගේ සේවා කාලය ද, එක් එක් විශේෂ සිද්ධියට බලපාන වැදගත් වෙනත් විස්තර ද සැලකිල්ලට ගනිමින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කළ යුතු ය.

(3) රාජ්‍ය සේවයේ තාවකාලික හෝ අනියම් තනතුරක් දරන කාන්තාවක වන්නා වූ යම් තැනැත්තියක, සේවා කාලය තුළ දී, හදිසි නීති නියෝග යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් හේතුවෙන් හෝ යම් ස්වාභාවික ආපදාවක් හේතුවෙන් ඇය සේවයේ ස්ථිර වීමට පෙරාතුව මිය යන අවස්ථාවක දී මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ තැනැත්තිය, මිය ගිය දින සිට මේ පනතේ 9 වන වගන්තියට අදාළ වන්නා වූ නිලධාරිනියක ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද ඒ තැනැත්තියගේ වැන්දඹු පුරුෂයා සහ දරුවන්—

(අ) එකී මිය ගිය දින සිට, ඇය ජීවත්ව සිටියේ නම් ඇයට අවුරුදු පනස් පහ එළඹෙන දින තෙක් කාලය තුළ, මිය යන විට ඇය විසින් උපයමින් තිබූ ගෙවීම් මත පදනම්ව මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කළ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය ; සහ

(ආ) ඇය ජීවත්ව සිටියේ නම් වයස අවුරුදු පනස්පහ වනතෙක් ලැබීමට හිමිකම් තිබූ සියලු වැටුප් වැඩිවීම් සහිත විශ්‍රාම වැටුපක්

ඇයට වයස අවුරුදු පනස් පහ ලැබිය යුතු දින සිට සහ ඉන් පසු ගෙවනු ලැබීමට හිමිකම තිබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තියක ඇය රාජ්‍ය සේවයට බැඳුණු දින සිට පනත යටතේ දායිකාවක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද නිලධාරිනියන් සහ (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද තැනැත්තියන් ඔවුන් මිය ගිය දින වන විට අරමුදලට අයවිය යුතු දායක මුදල් සම්පූර්ණ වශයෙන් ගෙවා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා —

"හදිසි නීති නියෝග" යන්නෙන් (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග කිසිවක් අදහස් වේ ;

"ස්වාභාවික ආපදා" යන්නට 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ ඒ සඳහා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ නිලධාරිනියන්ගේ වැන්දඹු පුරුෂයන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම.

9.(ආ) 9 වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද—

(අ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොට ඇති ; සහ

(ආ) වසර පහක සේවා කාලය සම්පූර්ණ කිරීම මත විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන,

යම් නිලධාරිනියකගේ වැන්දඹු පුරුෂයකු, ඒ නිලධාරිනියගේ අභාවයෙන් පසු, විශ්‍රාම යන අවස්ථාවේ ඒ නිලධාරිනිය විසින් උපයන ලද වැටුප මත පදනම්ව මේ පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලැබූ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

දායක මුදල් ප්‍රමාණය එකී නිලධාරිනිය විසින් උපයන ලද වැටුප මත පදනම්ව ගණනය කළ යුතු අතර, අවුරුදු පහක සම්පූර්ණ කාලයක් සඳහා ඒ දායක මුදල් පොළිය සමග ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර, එකී දායක මුදල් උපචිත පොළිය සමග ගෙවා ඇතිනම් හෝ එය එසේ ගෙවන තෙක්, මේ වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ "අවිවාහක ගැහැණු අනත් දරුවකු" යන වචන වෙනුවට "ගැහැණු අනත් දරුවකු" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"වැන්දඹු පුරුෂයකු නැවත විවාහ වීම සම්බන්ධයෙන් වූ විධිවිධාන.

18. (1) දායිකාවකගේ වැන්දඹු පුරුෂයකු නැවත විවාහ වීමේ දී, ඔහුට ඒ දෙවන විවාහය වූ දිනට පසුව සිට විශ්‍රාම වැටුප ලෙස—

(අ) ඒ දෙවන විවාහය සිදුවන අවස්ථාවේ දී ඔහු විසින් ලබමින් සිටි විශ්‍රාම වැටුපෙන් අර්ධයක් ; හෝ

(ආ) විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම තිබුණ ද, සැබෑ වශයෙන් එය එතෙක් නොලැබ සිටි විටෙක, ඒ දෙවන විවාහයට පෙරාතුව, වැන්දඹු පුරුෂයකු ලෙස එකී තත්ත්වයෙන් ඔහුට ලැබීමට තිබූ මුදල් ප්‍රමාණයෙන් අර්ධයක් හෝ,

ලැබිය යුතු වන්නේ ය.

(2) ඉහත (අ) හෝ (ආ) ඡේදවල නියමයන්ට අනුව වැන්දඹු පුරුෂයකුට ගෙවීම් කිරීමෙන් පසු, දෙවන විවාහයට පෙර වැන්දඹු පුරුෂයා ලබමින් සිටි විශ්‍රාම වැටුපේ ඉතිරි කොටස වැන්දඹු පුරුෂයාගේ ප්‍රථම විවාහයේ දරුවන් විසින් ලැබිය යුතු ය.

(3) ඒ දෙවන විවාහයේ කලත්‍රයාත් මේ පනත යටතේ දායිකාවක වන අවස්ථාවක දී සහ ඒ කලත්‍රයාගේ මරණින් පසු ඒ කලත්‍රයා විසින් විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවන ලද දායක මුදල් සම්බන්ධයෙන් ද විශ්‍රාම වැටුපක් ලැබීමට ඒ වැන්දඹු පුරුෂයා හිමිකම ලබන අවස්ථාවක දී (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල නියමයන්ට අනුව විශ්‍රාම වැටුපක් ලෙස ඔහු විසින් ලැබූ යම් මුදලක් ඔහුට ගෙවීම දෙවන විවාහයේ ඔහුගේ කලත්‍රයා මියගිය දින සිට බලපැවැත්වෙන පරිදි අවසන් කළ යුතු ය :

එසේ වුව ද, ඉහත විධිවිධාන සලසා ඇති පරිදි විශ්‍රාම වැටුපක් ගෙවීම අවසන් කරන ලද අවස්ථාවක දී, වැන්දඹු පුරුෂයාගේ පළමු විවාහයේ දරුවන්හට, ඔවුන්ගේ පියාගේ දෙවන විවාහයේ කලත්‍රයා මිය ගිය දින සිට (2) වන උපවගන්තියේ නියමයන්ට අනුව ඔවුන් ලබමින් සිටි කොටස සහ එකී අවසන් කිරීමට පෙරාතුව (1) වන උපවගන්තියේ විධිවිධානයන් ප්‍රකාරව තම පියා ලබමින් තිබූ යම් මුදලක් ද ලබා ගැනීමට හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, වැඩි දුරටත්, ඒ දෙවන විවාහය විසුරුවා හරින අවස්ථාවක දී වැන්දඹු පුරුෂයාට (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඔහු ලැබූ අර්ධය විශ්‍රාම වැටුපක් ලෙස ලැබීමට හිමිකම් ලැබිය යුතු අතර, 2 වන උපවගන්තිය යටතේ දරුවන්ට ඇති හිමිකමේ වෙනසක් නොවන්නේ ය.''.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය ''විශ්‍රාම වැටුපකට සුදුසුකම් නොලබන්නේ ය'' යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

''විශ්‍රාම වැටුපකට සුදුසුකම් නොලබන්නේ ය:

එසේ වුවද, තනතුර අවලංගු කිරීමේ හේතුවෙන් අකාලයේ විශ්‍රාම ගන්නා වූ ද, මේ පනතින් නියමකොට ඇති පරිදි දායක මුදල් ගෙවීම නතර කරනු ලැබුවා වූ ද දායිකාවක සම්බන්ධයෙන් වූ විට, එකී දායිකාව ඇයට වයස අවුරුදු පනස් පහ ලැබීමට පෙර විවාහයකට ඇතුල් වන්නේ නම්, හිඟව පවතින සියලු දායක මුදල්, ඒ මත පොළිය ද සමග ගෙවීමෙන් පසු, ඒ විවාහය සම්බන්ධයෙන්, මේ පනතේ විධිවිධාන අනුව ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට ඇයට හිමිකම ඇත්තේ ය.".

26අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරන අතර, එය එකී ප්‍රඥප්තියේ 26අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.

"විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වූ, විශ්‍රාම වැටුපක් නොමැතිව රාජ්‍ය සේවය හැරයන විවාහක රාජ්‍ය නිලධාරිනියන්ට අදාළ කරගත හැකි විශේෂ විධිවිධාන.

26අ. විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වූ සහ තම අනිවාර්ය විශ්‍රාම යාමේ වයස එළඹීමට පෙරාතුව වසර දහයක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කොට එහෙත් විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම නොලබා රාජ්‍ය සේවය හැරයන රජයේ නිලධාරිනියකට ඇය විසින් විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවන ලද දායක මුදල් සියල්ල හෝ ඉන් කොටසක් හෝ ආපසු ලැබීමට හිමිකම් නොමැත්තේ ය.

එසේ වුව ද, එකී රජයේ නිලධාරිනියගේ වැන්දඹු පුරුෂයාට සහ දරුවන්ට ඇයගේ අභාවයෙන් පසු ඇය විසින් ගෙවන ලද දායක මුදල මත මේ පනතේ විධිවිධාන අනුව ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 31අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එකී ප්‍රඥප්තියේ 31 අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"නියෝග.

31අ (1) අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ, නියෝග සෑදීමට මේ පනත මගින් බලය දෙනු ලැබූ සියලු කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලබන දිනයේ සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් දිනයක හෝ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම, එසේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොවූ සෑම නියෝගයක්ම එය යටතේ කලින් කරනු ලැබූ කිසිවකට අගතියක් නොවන පරිද්දෙන් එකී අනනුමතයේ සිට අවලංගු වූ ලෙස සැලකිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් අවලංගු වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.".

මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව මිය ගිය තැනැත්තන්ට ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ වගන්තියේ විධිවිධාන අදාළ වීම.

8. (1) 9අ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකව සිටි සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ඉහත කී (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් අවස්ථානුගත තත්ත්වයන් යටතේ මිය ගිය රාජ්‍ය නිලධාරිනියකගේ වැන්දඹු පුරුෂයාට සහ දරුවන්ට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(2) 9අ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, කාන්තාවක වූ සහ රාජ්‍ය සේවයේ තාවකාලික හෝ අනියම් තනතුරක සේවය කරමින් සිට මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ඉහත කී (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති අවස්ථානුගත තත්ත්වයන් යටතේ සේවයේ යෙදී සිටිය දී මියගිය තැනැත්තියකගේ වැන්දඹු පුරුෂයාට සහ දරුවන්ට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තියක ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ දායිකාවක ලෙස සැලකිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන උපවගන්තිය සහ (2) වන උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ කාර්යය සහ එහි (1) වන උපවගන්තියේ සඳහන් නිලධාරිනියන් ද, (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තියන් ද විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවිය යුතු සියලුම දායක මුදල් එකී එක් එක් තැනැත්තිය මිය ගිය දින වන විට සම්පූර්ණ වශයෙන් ගෙවා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

හිමිකම් පෑම අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කළ යුතු බව.

9. මේ පනතේ 8 වන වගන්තියේ සඳහන් යම් නිලධාරිනියකගේ හෝ තැනැත්තියකගේ අවස්ථාවෝචිත පරිදි යම් වැන්දඹු පුරුෂයකු හෝ දරුවකු හෝ දරුවන්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක දී හෝ ඊට පෙර, ඔවුන්ගේ හිමිකම් පෑම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියකින් එම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

අතීතයට බලපෑම.

10. මේ පනතේ 4, 5 සහ 6 වන වගන්ති ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වනු ලැබූ දිනයේ සිට බලපැවැත්වෙන ලෙස සැලකිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.